Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සතිය- 10

විෂය:-නර්තනය

Prepared by-කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

ශ්‍රේණිය :- 11

නර්තන කලාවේ සමාජීය වටිනාකම් ඇගයීම

නර්තන කලාව හැදෑරීමෙන් අප අත්පත් කරගන්නා සමාජීය වටිනාකම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමේදී එය ප්‍රධාන වශයෙන් අංග තුනක් යටතේ කරුණු ඉදිරිපත් කළ හැකි ය. ඒවා නම්

1 සහජීවනය සහ නායකත්ව ගුණාංග,

2 වේදිකා ප්‍රසංග,

3 අන්තර්ජාතික සම්බන්ධතා යන මූලික කරුණු වේ.

පුද්ගලයා සංවර්ධනය වීමෙන් මුළු මහත් සමාජය ම යහපත් සමාජයක් කරා යොමු කරනු ඇත. මෙහිදී විශේෂයෙන් අපට සංස්කෘතික හර පද්ධතීන් ආරක්ෂා කිරීම අවශ්‍ය වේ. ශාන්තිකර්ම වලදී සිදු කරන ආගන්තුක සත්කාර, බත බුලතින් සංග්‍රහ කිරීම, ශිල්පීන් හට ආචාර සමාචාර දැක්වීම ආදිය මෙහිදී මූලික වේ. විශේෂයෙන් ශාන්තිකර්ම අවස්ථාවලදී ඉහත කරුණු විදහා දැක්වේ .තවද ඔබ පාසලේ දී සිදු කරන පන්ති කාමර ක්‍රියාකාරකම් වලදී ඔබ හට පුහුණු කරන්නේ ද සමාජයීය වශයෙන් පොදු කටයුත්තකදී සහභාගි විය යුත්තේ හැසිරෙන්නේ කෙසේද යන්නයි.මේ තුල නායකත්වයට ගරු කිරීම, නායකයා ගේ උපදෙස් අනුව කටයුතු කිරීම ආදියට පුහුණුවක් ලබා දෙයි. සියලු දෙනාගේ අදහස් වලට අවධානය යොමු කරමින් මැදහත් සිතින් ඒවාට ගරු කිරීම මෙමගින් සිදුවේ. මෙහිදී විශේෂයෙන් සෑම දෙනාම එකට වාඩිවී ශාන්තිකර්ම නැරඹීම ,එසේම පන්ති කාමර ඉගෙනුම් ක්‍රියාවලියේ දී බිම වාඩිවී ශිල්ප ශාස්ත්‍ර හැදෑරීම උදාහරණ ලෙස දැක්විය හැකිය. මේ තුළින් සමාජයේ පවත්නා පන්ති භේදය කුල භේදය උස් පහත්කම් නොසලකා සහජීවනයක් ඇති කරගැනීම නිතැතින්ම සිදුවේ. සෞන්දර්යාත්මක සිතුවිලි මගින් යහපත් වින්දන ශක්තියක් ඇති වීම හා මේ තුළඇති වන්නා වූ සාරධර්ම වර්ධනය තුළින් ඊර්ෂ්‍යාව ,ක්‍රෝධය, පළිගැනීම ආදී දුර්ගුණයන් නැතිව ගොස් ගැටුම්කාරී තත්ත්වයකින් තොරව යහපත් සමාජයක් බිහිකිරීම ද මග පෑදේ.

වේදිකා ප්‍රසංග

ප්‍රසංග වේදිකාවට නර්තන කලාව පිවිසීම නිසා අත්පත්වන්නා වූ ප්‍රතිඵල සමුදායක් ඇත. කෙනෙකුට විවේකය ඵලදායි ලෙස ගත කිරීම, වින්දන ශක්තිය දියුණු කරගැනීම සඳහා ඒ තුළින් ලැබෙනුයේ මහත් රුකුලකි. මේ මගින් විවිධ නිර්මාණයන් එළිදකින අතර ඒවා අගය කිරීම පමණක් නොව විවිධ කලා කෘති නිර්මාණයකරණයටද යොමු විම නර්තන කලාවේ

සමාජීය වටිනාකම් අතරට ගත හැක. වර්තමානයේ වෘත්තිය නර්තන කණ්ඩායම් රැසක් බිහිවී ඇති අතරම ඔවුන් ඒ තුළින් ජනප්‍රිය වීම පමණක් නොව ආර්ථිකමය අතින් ලබා ගන්නා වාසියද මෙහිදී දැක්විය හැකිය .තවද ප්‍රසංග සඳහා උසස් නිර්මාණ කිරීමෙන් ජනතාවට සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් නර්තන කලාව යොදා ගැනීමට හැකි වන අතර දේශීය අනන්‍යතාවය රැක ගනිමින් උසස් අන්දමින් නිර්මාණ බිහිකිරීමේ දායකත්වය මේ මගින් ලබාදිය හැකිය. නර්තන ශිල්පියකු තම දක්ෂතා ප්‍රදර්ශනය කිරීමෙන් ලබාගන්නා තෘප්තිය සේම එයට ප්‍රේක්ෂක ප්‍රතිචාර ලැබීමෙන් ද ඔවුන් අපමණ සතුටක් ලබා ගනී. වර්තමාන සංගීත ප්‍රසංග වලදී ගීත අනුව කෙරෙන නර්තන ඉදිරිපත් කිරීම් ජනතාවට ඉතා සමීප අංගයක් වනවා සේම කුමන තරාතිරමක සිටියද නර්තනය පිළිබඳ පොදු රසවින්දනයකට ඒ තුළින් අවස්ථාව ලැබෙයි .එහි ගුණාත්මක බව කෙසේ වුවද ප්‍රමාණාත්මක තරගකාරී ස්වරූපයෙන් නව නිර්මාණ බිහි වීමට අවකාශයක් ලැබීම ද සමාජයීය වශයෙන් නර්තනය තුළ හිමිවන වාසියකි.

අන්තර්ජාතික සම්බන්ධතා

නර්තන කලාව හැදෑරීමෙන් අප අත්පත් කරගන්නා සුවිශේෂ ගුණාංගයක් ලෙස අන්‍ය කලාකෘති ඇගයීම දැක්වියහැක. විවිධ රටවල සංස්කෘතීන්ට අයත් නර්තන කලාවන් හැදෑරීමටත් ඒවා අගය කිරීමත් සිදු වන්නේ මෙකී ගුණාංග නිසාය. කලා කෘති විචාරවත්ව දකිමින් එකී අංගහාරයන් දේශීය නිර්මාණ සඳහා යොදා ගැනීමට අවස්ථාව ඇත. තවද රංගවස්ත්‍රාභරණ ,අංග රචනා ක්‍රම ,සංගීතය ආදී අංශ වලින් ඇති වන දියුණුව ද මෙහිදී දැක්විය හැකිය. නිදසුන් ලෙස ඉන්දියානු මැලේසියානු ආභාසය නිසා වර්තමාන දේශීය රංග වස්ත්‍රාභරණ වලට විසිතුරු ගල් අල්ලා අලංකාර කිරීම දැක්විය හැක. එසේම නර්තන කලාව හැදෑරීම තුළ දේශීය මෙන්ම විදේශීය රටවලට ගොස් නිසි පරිදි ම නර්තන අධ්‍යයනය කිරීමට අවස්ථාව ලැබීම ද විදේශ ගුරු සිසු සම්බන්ධතා වර්ධනය වීමෙන් අන්තර් සබඳතා ගොඩනගා ගැනීමට අන්‍ය සංස්කෘතීන් හඳුනා ගැනීමටත් අවස්ථාව ලැබේ.තවද විදේශ සංචාරවලට සම්බන්ධ වී දේශීය නර්තන කලාව ලෝකයට හඳුන්වා දීම සේම රාජ්‍ය ආයතන තුළින් ශිෂ්‍යත්ව ලබා විදේශීය අධ්‍යාපනය ලබමින් ඒ ඒ රටවල අන්තර්ජාතික උළෙලවල් නියෝජනය කරමින් නර්තනය දැක්වීමට ද අවස්ථාව උදාවේ.නිදසුන් ලෙස

- ජාතික තරුණ සේවා සභා නර්තන කණ්ඩායම
- රාජ්‍ය නර්තන කණ්ඩායම
- ත්‍රිවිධ හමුදාවන්ට අයත් නර්තන කණ්ඩායම් දැක්විය හැක .මෑත කාලයේදී අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය එකතුව කරන ලද චෝගම් නර්තන හා සංස්කෘතික ප්‍රසංගය මීට නිදසුනකි .චෝගම් නැතහොත් පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුවට නර්තන හා සංස්කෘතික අංග ඉදිරිපත් කිරීමේදී රාජ්‍ය නායකයන් පිළිගැනීම සඳහා පාසල් නර්තන කණ්ඩායම්, රාජ්‍ය නර්තන කණ්ඩායම්, කලායතන හා සංස්කෘතික මධ්‍යස්ථාන නර්තන කණ්ඩායම් එහිදී සහභාගි විය. එපමණක් නොව වර්තමානයේ දී නර්තන විෂය විශ්වවිද්‍යාල මට්ටම දක්වා ඉහළට ගොස් ඇති අතර ඒ තුළින් විදේශීය රටවලට ගොස් ආචාර්ය උපාධිය ලබා ගැනීමට හා විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට ශිෂ්‍යත්වය ලබාගැනීමටද මේ තුළ ඇති තවත් වාසියකි. ඒ තුළින් නර්තන විෂයේ සංවර්ධනයට ලැබෙනුයේ මහත් රුකුලකි.

පැවරුම

1" නර්තන කලාව හැදෑරීමෙන් සහජීවනය හා නායකත්ව ගුණාංග වර්ධනය වේ" ඔබේ අදහස් ඉදිරිපත් කරන්න.

2 අන්තර්ජාතික සම්බන්ධතා තුළින් දේශීය නර්තන කලාවට සිදු වූ ප්‍රගමනය පිළිබඳ විමසුමට ලක් කරන්න

3 විවිධ නර්තන නිර්මාණයන් බිහි වීමත් සමග ප්‍රේක්ෂක ප්‍රතිචාර එයට බහුලව ලැබේ. වේදිකා ප්‍රසංග නර්තන නිර්මාණ පිළිබඳ විමසීමක් කරන්න

4 නර්තන කලාවේ සමාජයීය වටිනාකමක් ලෙස වෘත්තීය නර්තන කණ්ඩායම් බිහි වීම සිදු වී ඇත .එහි යහපත් හා අයහපත් කරුණු පෙළ ගස්වන්න